# ඌව පළාතේ ප්‍රධාන ලේකම් කාර්යාලය

## ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් දීපව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | අවශ්‍ය සුදුසුකම් | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු පවතින සේවා ස්ථානය |
|---|---|---|---|---|
| 01 | පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, පරිපාලන I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම | 01 | ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| සටහන:- අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන විට තනතුරට බඳවා ගැනීමට අදාළ සියළුම සුදුසුකම් සපුරා තිබිය යුතු අතර, සුදුසුකම් සනාථ කරන සියලුම සහතික වල ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය | | | | |

**<u>බඳවා ගැනීමේ සුදුසුකම්</u>**

පහත දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, පරිපාලන I ශ්‍රේණියට අයත් අයදුම්කරුවන් අතරින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහලම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත තනතුර සඳහා බඳවා ගනු ලැබේ.

01. අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා සපුරා තිබිය යුතු සුදුසුකම්

i. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, පරිපාලන I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
ii. අයදුම්පත් කැඳවන දිනට ආසන්න වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iii. අයදුම්පත් කැඳවන දිනට ආසන්න වසර 05 ක කාර්ය සාධන ඇගයීම සතුටුදායක මට්ටමින් හෝ ඉන් ඔබ්බට ලඟා කරගෙන තිබීම හා එම වර්ෂවලට අදාළව වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම

02. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු සුදුසුකම්

i. අයදුම්කරුගේ නායකත්වයෙන් යුතුව ලබාගත් ජාතික මට්ටමේ ජයග්‍රහණ තිබීම.
ii. ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ කෘතීන් ප්‍රසිද්ධ කර තිබීම.
iii. ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයට අයත් විෂයන් පිළිබඳව දේශීය හෝ විදේශ පුහුණු ආයතන මඟින් ලබා ඇති පුහුණු

02 පිටුවට

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

ජ්‍යෙෂ්ඨතාවය - ලකුණු 40
කුසලතාවය - ලකුණු 60

02. අයදුම්කරුවන් විසින් මේ සමග අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කර ගත් ජීව දත්ත තොරතුරු ඇතුළත් නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානී හා අමාත්‍යාංශ ලේකම් මගින්, අයදුම්කරන තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරණ තනතුරෙන් නිදහස් කළ හැකි බවට නිර්දේශය ද සමග 2025.08.25 වන දින හෝ එදිනට පෙර, "ඌව පළාතේ ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, ඌව පළාත් සභාව, බදුල්ල" යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑල මගින් එවිය යුතු ය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "ඌව පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සඳහා අයදුම් කිරීම" යනුවෙන් සඳහන් කර එවිය යුතු ය.

03. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ දිනට සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීම හෝ නොකිරීම හෝ මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමා සතු වේ. මේ පිළිබඳව විස්තර කාර්යාල වේලාව තුළ දුරකථන අංක 055-2229426 ඇමතීමෙන් ලබා ගත හැකි වේ.

04. එසේම, සුදුසුකම් සම්පූර්ණ කළ පරිපාලන I ශ්‍රේණියේ නිලධාරියෙකු මගින් පළාත් ආයුර්වේද කොමසාරිස් තනතුර සම්පූර්ණ කළ නොහැකි වුවහොත් පමණක් පහත සුදුසුකම් සම්පූර්ණ කරන ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, පරිපාලන II ශ්‍රේණියේ නිලධාරීන් වැඩ බැලීමේ පදනම මත බඳවා ගැනීමට සලකා බලනු ලැබේ. ඒ සඳහා පහත සුදුසුකම් සහිත නිලධාරීන්ට ද අයදුම්කළ හැකි ය.

i. ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ, පරිපාලන II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.
ii. රෝහල් පරිපාලනය පිළිබඳව වසර තුනකට (03) නොඅඩු පළපුරුද්දක් තිබීම.
iii. අංක 2199/10 හා 2020.10.27 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 10.4.1 හි iii යටතේ වන පශ්චාත් උපාධි සහතිකයක් හෝ ඊට වඩා ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලබා තිබීම.

(නිහාල් ගුණරත්න)
ඌව පළාත් ප්‍රධාන ලේකම් - වැ.බ.

2025.07.31 දින

නිහාල් ගුණරත්න
ඌව පළාතේ ප්‍රධාන ලේකම් (වැ.බ)
ඌව පළාත් සභාව
බදුල්ල